# ලංසු කැඳවීම

## සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
## රජයේ රෝහල්වල කිලිටි රෙදි සෝදා පිරිසිදු කිරීම 2020/2021

හැඳින්වීම

01. සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව "සී$_1$" සභාපති විසින් 2020/2021 වර්ෂය සඳහා පහත සඳහන් රෝහල් හා ආයතනයන්හි කිලිටි රෙදි සේදීමේ සේවාව අඛණ්ඩව පවත්වා ගෙන යාම සිදුකළ හැකි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

02. මේ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන් එක් රෝහලක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සඳහා සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ආපසු නොගෙවනු ලබන ඒ ඒ රෝහලට අදාලව පහත වගුවේ සඳහන් කර ඇති මුදල ලංසු ලියවිලි ගාස්තු වශයෙන් ගෙවා ලබාගත් ලදුපත සමඟ ලිඛිත ඉල්ලීමක් හා තම ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් ඉදිරිපත් කිරීමෙන් **2020.06.30** වන දින සිට **2020.07.20** වන දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනවල පෙ.ව.**9.30** සිට ප.ව.**2.00** දක්වා කාලය තුළ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයෙන් ලංසු ලියවිලි ලබාගත හැක.

| අනු අංකය | රෝහල/ ආයතනයේ නම | වත්කම් සහතිකයේ වටිනාකම රු. | වාර්ෂික ඇස්තමේන්තු මුදල රු. | ලංසු ලියවිලි ගාස්තුව රු. |
|---|---|---|---|---|
| 1 | ජාතික රුධිර මධ්‍යස්ථානය - නාරාහේන්පිට | 150,000.00 | 880,800.00 | 1,000.00 |
| 2 | මහ රෝහල - කළුතර | 500,000.00 | 24,498,000.00 | 3,500.00 |
| 3 | උතුරු කොළඹ ශික්ෂණ රෝහල - රාගම | 500,000.00 | 51,965,702.55 | 12,500.00 |
| 4 | පුනරුත්ථාපන රෝහල - රාගම | 300,000.00 | 2,522,400.00 | 1,000.00 |
| 5 | මුල්ලේරියාව අංශ II රෝහල | 300,000.00 | 1,802,400.00 | 1,000.00 |
| 6 | නැගෙනහිර කොළඹ මූලික රෝහල - මුල්ලේරියාව | 300,000.00 | 7,221,240.00 | 1,000.00 |
| 7 | ස්වසන රෝග පිළිබඳ ජාතික රෝහල -වැලිසර | 500,000.00 | 4,609,200.00 | 1,000.00 |
| 8 | ද සොයිසා කාන්තා රෝහල - කොළඹ 08 | 500,000.00 | 6,837,600.00 | 1,000.00 |
| 9 | ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය - අංගොඩ (මුල්ලේරියාව හෙද විදුහල) | 150,000.00 | 6,974,400.00 | 1,000.00 |
| 10 | දිසා රෝහල - කඳාන | 300,000.00 | 2,190,000.00 | 1,000.00 |
| 11 | කාසල් වීදියේ කාන්තා රෝහල | 500,000.00 | 33,433,800.00 | 3,500.00 |
| 12 | අපේක්ෂා රෝහල, මහරගම | 500,000.00 | 15,993,000.00 | 3,500.00 |
| 13 | ජාතික අක්ෂි රෝහල - කොළඹ | 500,000.00 | 3,332,400.00 | 1,000.00 |
| 14 | ජාතික බෝවන රෝග විද්‍යායතනය - අංගොඩ (අයි.ඩී.එච්.) | 300,000.00 | 6,050,000.00 | 1,000.00 |
| 15 | දකුණු කොළඹ ශික්ෂණ රෝහල - කළුබෝවිල | 500,000.00 | 26,000,000.00 | 3,500.00 |
| 16 | රිජ්වේ ආර්යා ළමා රෝහල - කොළඹ10 | 500,000.00 | 2,328,000.00 | 1,000.00 |

| අනු අංකය | රෝහල/ ආයතනයේ නම | වත්කම් සහතිකයේ වටිනාකම රු. | වාර්ෂික ඇස්තමේන්තු මුදල රු. | ලංසු ලියවිලි ගාස්තුව රු. |
|---|---|---|---|---|
| 17 | ක්ෂය රෝග මර්ධන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන<br>• ජාතික ක්ෂය රෝග රසායනාගාරය - වැලිසර<br>• ගම්පහ දිස්ත්‍රික් ලය විකිත්සාගාරය - වැලිසර | 150,000.00 | 152,928.00 | 1,000.00 |
| 18 | පවුල් සෞඛ්‍ය කාර්යාංශය | 150,000.00 | 240,000.00 | 1,000.00 |
| 19 | මුඛ සෞඛ්‍ය ආයතනය - මහරගම | 150,000.00 | 555,000.00 | 1,000.00 |
| 20 | ශ්‍රී ලංකා ජාතික දන්ත වෛද්‍ය රෝහල (ශික්ෂණ) - කොළඹ 07 | 500,000.00 | 1,828,000.00 | 1,000.00 |
| 21 | නව දිස්ත්‍රික් මහ රෝහල - හම්බන්තොට | 500,000.00 | 57,624,300.00 | 12,500.00 |
| 22 | දිස්ත්‍රික් මහ රෝහල - හලාවත | 500,000.00 | 12,378,000.00 | 3,500.00 |
| 23 | සිරිමාවෝ බණ්ඩාරණායක ළමා රෝහල - පේරාදෙණිය | 500,000.00 | 167,670.00 | 1,000.00 |
| 24 | මූලික රෝහල - ගම්පොල | 300,000.00 | 2,299,317.30 | 1,000.00 |
| 25 | මහ රෝහල - කෑගල්ල | 500,000.00 | 18,444,000.00 | 3,500.00 |
| 26 | ශික්ෂණ රෝහල - කරාපිටිය | 500,000.00 | 29,212,800.00 | 3,500.00 |
| 27 | හෙද විදුහල - කුරුණෑගල | 150,000.00 | 175,800.00 | 1,000.00 |
| 28 | ශික්ෂණ රෝහල - යාපනය | 500,000.00 | 26,000,000.00 | 3,500.00 |
| 29 | මහ රෝහල - ත්‍රිකුණාමලය | 500,000.00 | 3,099,600.00 | 1,000.00 |
| 30 | මහ රෝහල - පොළොන්නරුව | 500,000.00 | 26,430,000.00 | 3,500.00 |
| 31 | මහ රෝහල - නුවරඑළිය | 500,000.00 | 9,090,000.00 | 1,000.00 |
| 32 | මූලික රෝහල - කන්තලේ | 300,000.00 | 3,304,200.00 | 1,000.00 |
| 33 | ශික්ෂණ රෝහල - මහමෝදර | 500,000.00 | 13,245,333.00 | 3,500.00 |
| 34 | ශික්ෂණ රෝහල - අනුරාධපුර | 500,000.00 | 41,736,000.00 | 3,500.00 |
| 35 | මහ රෝහල - මොණරාගල | 500,000.00 | 5,691,720.00 | 1,000.00 |
| 36 | ශික්ෂණ රෝහල - කුරුණෑගල | 500,000.00 | 43,374,000.00 | 3,500.00 |
| 37 | මහ රෝහල - බදුල්ල | 500,000.00 | 9,541,800.00 | 3,500.00 |
| 38 | මහ රෝහල - රත්නපුරය | 500,000.00 | 11,749,212.00 | 3,500.00 |
| 39 | ශික්ෂණ රෝහල - කුලියාපිටිය | 500,000.00 | 10,000,000.00 | 3,500.00 |

03. එක් රෝහලකට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා ලංසු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන්නේ නම් ඒ සඳහා වෙන වෙනම ලංසු ලියවිලි ලබාගත යුතු අතර, එක් එක් ආයතන/රෝහල් සඳහා වෙන වෙනම ලංසු ලියවිලි ඉදිරිපත් කල යුතුය.

04. මෙම කොන්ත්‍රාත්තුව සඳහා පහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ලිය යුතුය.

I. රජයේ අනුමත ප්‍රජා සංවිධාන සඳහා අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් නිකුත් කල ලියාපදිංචි සහතිකය.

II. රෙදි සේදීමේ, වියළීමේ සහ මැදීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බවට එම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත් සහතිකය (ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද)

III. අයදුම් කරනු ලබන රෝහලේ සේදිය යුතු රෙදි ධාරිතාවට ප්‍රමාණවත් පරිදි රෙදි වියළීමේ පහසුකම් ඇති බවට තහවුරු කිරීමේ සහතිකයක්.

IV. රෙදි සෝදන ස්ථානය සහ වියලන ස්ථාන අයත් වන ප්‍රදේශය භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් නිකුත් කරන ලද රෙදි සෝදන සහ වියලන ස්ථාන පිළිබඳ යෝග්‍යතා සහතිකය.

V. පෙර සේවා පළපුරුද්ද පිළිබඳව ආසන්න වර්ෂ 03ක පළපුරුද්ද ඇතුළත් සහතිකය (ශික්ෂණ රෝහල් සහ මහ රෝහල් සඳහා ඉදිරිපත් වීමේදී මසකට රෙදි කෑබලි 500 කට වැඩි ප්‍රමාණයක් සෝදන ආයතනයක් / ආයතන මගින් ලබාගත් පළපුරුද්ද පිළිබඳ සහතිකයක් / සහතික ඉදිරිපත් කල යුතුය.)

* **අනෙකුත් සුදුසුකම් සියල්ල සපුරන ලද සේවා පළපුරුද්ද පමණක් නොමැති නවක අයදුම්කරුවෙකු මේ සඳහා ඉදිරිපත්වන්නේ නම් ඔහුට හෝ ඇයට 15%ක කාර්යසාධන ඇපකරයක් ලබාගැනීමට යටත්ව මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සළකා බැලේ.**

VI. එක් එක් රෝහල සඳහා පහත පරිදි ඉදිරිපත් කල යුතු වටිනාකම් සහතික වල වටිනාකම අංක 02 යටතේ දක්වා ඇති වගුවෙහි සඳහන් වේ. ලංසු ලියවිලි නිකුත් කරන දින සිට මාස 06 කට වලංගු වටිනාකම් සහතික පහත පරිදි ඉදිරිපත් කල යුතුය.

| | |
|---|---|
| a) ශික්ෂණ රෝහලක් හෝ මහ රෝහලක් සඳහා | රු. 500,000.00 |
| b) මූලික රෝහලක් හෝ දිසා රෝහලක් සඳහා | රු. 300,000.00 |
| c) සෞඛ්‍ය ආයතනයක් හෝ හෙද විද්‍යාලක් සඳහා සහ වෙනත් | රු. 150,000.00 |

VII. මධ්‍යම පරිසර අධිකාරිය මගින් නිකුත් කරන ලද පරිසර බලපත්‍රය.

VIII. පොදු කොන්ත්‍රාත් පනතේ 8 වැනි වගන්තිය යටතේ වන ලියාපදිංචි සහතිකය. (ඒ ඒ රෝහල සඳහා වෙන වෙනම ලබාගත් ලියාපදිංචි සහතික ඉදිරිපත් කල යුතුය.)

05. අසම්පූර්ණ අයදුම්පත් හා ඉදිරිපත් කල යුතු ඉහත I - VIII දක්වා සියලු ලේඛනගත සාක්ෂි නිසි පරිදි සහතික කර අයදුම්පත සමඟ අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙන අතර අදාල ලිපි ලේඛන පසුව භාරගනු නොලැබේ.

06. ලංසු ලියවිලි මුල් පිටපත හා අනු පිටපත වශයෙන් සකස් කර කවර දෙකක බහා එම කවර දෙක තනි කවරයක බහා සීල් තබා වම්පස ඉහල කෙලවරෙහි "**........................................... රෝහල සඳහා 2020.07.21 දින පෙ.ව.10.00ට විවෘත කිරීමට නියමිත 2020/2021 වර්ෂය සඳහා කිලිටි රෙදි සේදීමේ ප්‍රසම්පාදනය"** යනුවෙන් සඳහන් කල යුතුය.

07. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි **2020.07.21** දින පෙ.ව **10.00** හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව "සී$_1$", සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය (නව ගොඩනැගිල්ල), ප්‍රසම්පාදන අංශය, 2 වන මහල, අංක 26, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ එම ලිපිනයේ පිහිටි ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කල හැකිය.

08. **2020.07.21** දින පෙ.ව. **10.00** ට ලංසු භාරගැනීම අවසන් වූ විගස එම ස්ථානයේදීම ලංසු අයදුම්පත් විවෘත කරන අතර, ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගිවීමට අවසර දෙනු ලැබේ.

09. රජයේ කොන්ත්‍රාත් කොන්දේසි කඩකර අසාධු ලේඛණ ගත කොට ඇති පුද්ගලයින්ට මෙම ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් විය නොහැක.

10. ඉදිරිපත් කරනු ලබන ලංසු සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුය.

11. ලංසු ලියකියවිලි මුදල් ගෙවීමකින් තොරව සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයේ දී සාමාන්‍ය රාජකාරි වේලාව තුළ දී පරික්ෂා කිරීමට හැකිය. වැඩිදුර තොරතුරු සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයේ දුරකථන අංක 011 - 2112717/ 011 - 2112714 මඟින් විමසිය හැක.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව "සී1"
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය (නව ගොඩනැගිල්ල),
ප්‍රසම්පාදන අංශය, 2 වන මහල,
අංක 26 , ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.